10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය


## අභියෝග ජයගත් සිදුහත් බෝසතාණෝ




අන්තර්ගතය - සාගරිකා වික්‍රමආරච්චි - බප/කැල/කිරිල්ලවල ම.ම.වි.
සැකසුම - ටී.එම්.ගයාත්‍රී ලක්මාලි - බ/පුස්සැල්ලාකන්ද මහා විද්‍යාලය , පතනවත්ත

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# බෝසතුන්ට දේවාරාධනා කිරීම



## පස් මහ බැලුම් / පංච විලෝකන




# බෝසත් උපත



# උපතේදී සිදු වූ අසිරිමත් සිදුවීම්

- දෙව්බඹුන් නමස්කාර කිරීම.
- මහ පොළොව කම්පාවීම.
- පියවර තැබීම - තබන පියවර පාසා නෙළුම් මල් පිපීම.
- සිංහනාද පැවැත්වීම.

අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුබබ්භවො



මම ලොවට අග්‍ර වෙමි
මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි
මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි
මෙය මාගේ අවසන් උපත යි
යළි මාගේ පහළ වීමක් නැත

## උපත ලැබූ ආසන්න කාලයේදී සිදුවූ වැදගත් සිදුවීම්




- අසිත තවුසා කුමරු බැලීමට පැමිණීම.
  එම අවස්ථාවේදී කුමරාගේ දෙපා තවුසාගේ හිස මත වැදුනු අතර එම මොහොතේ අසිත තවුසා කුමරුට නමස්කාර කළේය.
- එම අවස්ථාවේදී පිය රජතුමාද කුමරාට නමස්කාර කිරීම.
- උපතින් සත් දිනකින් මහමායා දේවිය කළුරිය කිරීම.
- පස් මසකට පසු පැවැත්වූ වප් මඟුල් උත්සවයේදී කුමරු අහසට නැග භාවනානුයෝගීව සිටීම.
- පියරජතුමා දෙවන වරට කුමරුට නමස්කාර කිරීම.
- කුමරු ඉපදී දින පහකින් එකල ප්‍රසිද්ධ රාම, ධජ, ලක්ඛන, මන්ත, සුයාම, සුදත්ත, කොණ්ඩඤ්ඤ, භෝජය යන උගත් බමුණන් ප්‍රධාන 108 දෙනෙක් පැමිණ නම් තැබීම සිදු කිරීම.
- ලොව සියල්ලන්ටම අර්ථයක් සිදු කරන බැවින් "***සිද්ධාර්ථ***" යන නම තැබීම.

# ශිල්ප හැදෑරීම

- සිදුහත් කුමරුගේ ප්‍රධාන ගුරුතුමා **සර්වමිත්‍ර බමුණු පඬිතුමා** ය.

- නම් තැබීමේදී බමුණන් පැවසූ අනාවැකි නිසා සුදොවුන් රජු කුමරුට සක්විති රජකම සඳහා අවශ්‍ය ලෞකික ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීමට සැළැස්වීය.




- ✓ කඩු ශිල්ප
- ✓ දුනු ශිල්ප
- ✓ ඇතුන් පිට යාම
- ✓ අසුන් හැසිරවීම
- ✓ රාජ නීතිය
- ✓ නැටුම් කලාව
- ✓ සංගීතය

| | |
|---|---|
| ගුරු සිත | නොරිදවා |
| වේලාව | නොවරදවා |
| බැතිපෙම් | උපදවා |
| අකුරු උගනී කුමරු | සොඳවා |

# යෞවන අවධිය

සිද්ධාර්ථ කුමරු ලෞකික සැප සම්පත් වලින් පිරි සුවපහසු ජීවිතයකට හුරු කරවීමට පියරජු ගත් උත්සාහයන්



- සොළොස් වියේදී, යශෝධරා කුමරිය විවාහ කර දීම.
- හේමන්ත, ගිම්හාන, වස්සාන ඍතු වලට ගැළපෙන ලෙස රම්‍ය, සුරම්‍ය, සුභ මාළිගා ත්‍රිත්වය තනා දීම.
- සැම අවශ්‍යතාවයක් සඳහාම දැසි දස් කම්කරුවන් යෙදීම.
- දිනපතා සතුටින් කාලය ගත කිරීමට උත්සව , සැනකෙළි සංවිධානය කිරීම.
- සුරූපී නාට්‍යාංගනාවන් විසින් ඉදිරිපත් කරන රංගනයන් දැකීමට සැළැස්වීම.


# ලොව යථාර්ථය වටහා ගැනීම සඳහා සිද්ධාර්ථ කුමරු මුහුණ දුන් අවස්ථා

- උයන් සිරි නැරඹීමට යන අවස්ථාවේ සතර පෙර නිමිති දැකීම.



ඉපදීමේ සිට මරණය දක්වා, ජීවිත අවස්ථා මහත් වූ දුකක් ගෙන දෙන බව අවබෝධ වීම.

## ලොව යථාර්ථය වටහා ගැනීම සඳහා සිද්ධාර්ථ කුමරු මුහුණ දුන් අවස්ථා



- **රාහුල කුමරුගේ උපත සිදුවීම.**

රාහුලො ජාතො - රාහුලයෙක් උපන්නා
බන්ධනං ජාතං - බන්ධනයක් ඇතිවුණා

විමුක්ති සාධනයට එය බාධාවක් බව අවබෝධ වීම.

- **නාටිකාංගනාවන්ගේ විප්‍රකාර දැකීම.**

සුරූපිණියන් ලෙස සිටින්නවුන් මොහොතකට පසු සිටින තත්වය දැක, ජීවිතයේ අස්ථිර බව අවබෝධ කර ගැනීම.

- **කිසාගෝතමියගේ නිබ්බුත පද ඇසීම.**

## බෝසත් සිරිතෙහි ප්‍රකට වන අභියෝගාත්මක අවස්ථා

- තව්තිසා දෙව්ලොවදී මනු ලොව උපත ලබන්නට දේව ආරාධනා ලද විටද උපත ලබන ස්ථානය තීරණය කිරීම.
  පංච විලෝකන බලා එම අභියෝගය ජය ගත්හ.
- ඉතා කෙටි කාලයකදී මැනවින් ශිල්ප හැදෑරීය. යෞවනත්වයට පත් සිද්ධාර්ථ කුමරුට අභියෝග ජය ගැනීමට එයින් මහත් පිටුවහලක් ලැබුණි.
- කාමභෝගී ජීවිතය සහ රජ සැප විමුක්තිගාමී මගට අභියෝගයක් විය.
- මැදි විය ගෙවීමෙන් පසු මහළු වීම, ලෙඩවීම වැනි ජීවිත අභියෝගයන්ට තමාටද මුහුණ දීමට සිදුවන බව අවධාරණය වීම.
- නිශ්කාමී පැවිදි දිවිය දුකින් මිදීමේ මඟ බැව් අවබෝධ කර ගෙන අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් එම අභියෝගයට සාර්ථකව මුහුණ දුන්හ.
- පිය රජතුමාගේ අපේක්ෂා ඉටුකිරීමද අභියෝගයක් විය.
- සය වසරක දුෂ්කර ක්‍රියා සමයද අභියෝගයකි.
- සියළු කෙළෙස් ප්‍රහීණ කොට
  ලොව්තුරා බුද්ධත්වයට පත්වීමද අභියෝගයකි.

## ජීවිත අභියෝග ජය ගැනීමට උපකාරී වූ ගුණාංග

- ✓ උට්ඨාන වීර්යය
- ✓ කැපවීම
- ✓ නිවැරදි ගමන් මග
- ✓ ඉවසීම
- ✓ අවංකබව
- ✓ නින්දා ගැරහුම් හමුවේ නොසැලී සිටීම



## පැවරුම් 01

සිද්ධාර්ථ බෝසතාණෝ තව්තිසා දෙව්ලොව දී මනුලොව උපත ලැබීමට පංච විලෝකන පිළිබඳව සොයා බැලූ බව අපි උගත්තෙමු.
මෙම සිද්ධාන්තය පසුබිම් කරගෙන ඔබගේ ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා සාර්ථක කර ගැනීමට ඉහත දැක්වූ පංච විලෝකනයන් භාවිතා කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.

## පැවරුම් 02

සිංහ නාදය තුළින් කුඩා වියේදීම සිදුහත් කුමරු තම උත්පත්තියේ අරමුණු දැක ලොවට ප්‍රකාශ කළහ. බෝසත් දරුවෙකු වන ඔබද ඔබේ ජීවිත අරමුණු ලියා ඔබගේ නිවසේ ප්‍රදර්ශනය කරන්න.

## පැවරුම් 03

සොළොස් විය සපිරුණු සිද්ධාර්ථ බෝසතාණෝ සිය ඥාතිහිතමිත්‍රාදීන් අභිමුව ශිල්ප දැක්වීමේ අවස්ථාවෙන් ඔබට ගත හැකි ආදර්ශ මොනවාද?

## හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරන්න

| |
|---|
| අභිනිෂ්ක්‍රමණය , අෂ්ට , වයසට යාම , සිද්ධාර්ථ , ලෙඩ වීම , කිසාගෝතමී , කෝසල , ශාක්‍ය , සප්ත , කෝලිය |

1. සුද්ධෝදන රජතුමා ........................ වංශික වූ අතර මහමායා දේවිය දෙව්දහ නුවර ........................... වංශික කුමරියක් වූවාය.
2. සිද්ධාර්ථ කුමරු උපත ලද ලුම්බිණී සල් උයන .............................. රාජ්‍යයට අයත් වූවකි.
3. ලොව සියල්ලන්ටම අර්ථයක් සිදු කරන බැවින් ............................... නම් විය.
4. අසීමිත වූ කාමයන්ගෙන් නික්ම යාම ........................... නම් වෙයි.
5. ආලාර කාලාම නම් තාපසතුමා ................................. සමාපත්ති ලාභී වූ අතර උද්දකරාමපුත්ත තාපසතුමා ............................. සමාපත්ති ලාභී ආචාර්යවරයෙක් විය.
6. නිබ්බුත පද අසා පැහැදුනු සිද්ධාර්ථ කුමරු තම මුතුහර ..................................... ට තෑගි කළේය.
7. ව්‍යාධිය යනු ............................ වන අතර ජරාව යනු .......................... යි.